# බද්ධ අංකුර ප්‍රචාරක තවාන්

චන්ද්‍රා සමරනායක

බද්ධ අංකුර ප්‍රචාරක තවාන් පිහිටුවීමේදී හා පවත්වාගෙන යෑමේදී නිර්දේශිත පිළිවෙත් නිසියාකාරව භාවිතාකර නොමැති බව, මෑතකදී දිවයින පුරා ඇති බද්ධ අංකුර ප්‍රචාරන තවාන් අලලා කරනු ලැබූ සමීක්ෂණයකදී හෙළිවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම තවාන්වල නොයෙක් ක්ලෝන මිශ්‍ර වීමක් සිදුවී ඇත. ''කොරිනොස් පෝරා'' පත්‍ර පුල්ලි රෝගයට ගොදුරු වන ආර්.ආර්.අයි.සී. 103 ක්ලෝනය සිටුවා ඇති සුළු රබර් වගාවන් හා රාජ්‍ය වගාවන් හා රාජ්‍ය වැවිලිවල කරන ලද සමීක්ෂණයේදී මෙම කරුණ තවදුරටත් සනාථ විය.

වැඩි වර්ධන වේගයකින් යුත්, වැඩි අස්වනු ලබා දෙන, රෝග ප්‍රතිවිරෝධි ක්ලෝන මගින් ලබා ගත හැකි විශිෂ්ඨ ප්‍රතිඵල සඳහා, නිසැකයෙන්ම එම ක්ලෝන වලින්ම ලබාගත් අංකුර යොදා පිළිවෙල කරගත් බද්ධ පැලම පමණක් භාවිතා කිරීම ඉතා ම වැදගත් වේ. නොයෙක් ක්ලෝන මිශ්‍රවී වැඩෙන බද්ධ අංකුර ඇති ප්‍රචාරන තවානකින් ලබාගන්නා අංකුර වලින් මෙම කාර්යය ඉටුකර ගත නොහැකිය.

තවාන් තුළ ක්ලෝනයන්ගේ මිශ්‍රවීම වැළැක්වීම අරමුණු කොට බද්ධ අංකුර ප්‍රචාරන තවාන් පිහිටුවීමේදී හා පවත්වාගෙන යෑමේදී වැදගත්වන කරුණු මෙම ලිපියෙන් විස්තර කෙරේ.

1. තවානක් පිහිටුවීමේදී, ප්‍රචාරනය කිරීමට බලාපොරොත්තුවන ක්ලෝනයේ අංකුර නිසැකයෙන්ම එම ක්ලෝනය යැයි සහතික කරන ලද තවානකින් පමණක් ලබා ගත යුතුයි.

   තවානක් ස්ථාපිත කිරීමට බද්ධ පැල පිළියෙල කිරීමේදී, ක්ලෝන සමූහයක් බද්ධ කරන්නේ නම්, එක් එක් ක්ලෝන, ග්‍රාහක තවානේ වෙන් වෙන්ව බද්ධ කල යුතුයි. ඒ සමඟම එක් එක් ක්ලෝනයේ නම පැහැදිලිව ග්‍රාහක කඳේ ලකුණු කිරීමෙන ක්ලෝනවල මිශ්‍ර වීම වැළැක්විය හැකිය. මෙසේ පිළියෙල කර ගන්නා බද්ධ පැල, පසුව නග්න මුල් සහිත බද්ධ පැල මෙන් හෝ, 6 – 7 මාසයක් පොලිතීන් මලුවල වැඩෙන්නට හැරීමෙන් පසුව, හෝ තවානේ සිටුවිය හැකියි.

2. අනුජයෙන් පැන නගින අංකුරය හැර ග්‍රාහක කඳෙන් පැන නගින අනෙක් සෑම අංකුරයක්ම කපා ඉවත් කිරීම ඉතාමත් වැදගත්ය. සමහර තවාන් හිමියන් අනුජයෙන් වැඩෙන අංකුරය නොව ග්‍රාහක කඳෙන් නැගෙන අංකුරයක් වැඩෙන්නට සලස්වා, එසේ වැඩුනු පැලවල අතු යොදා ගනිමින් බද්ධ පැල ලබාගෙන ඇති අවස්ථා බොහොමයක් අප විසින් කරණු ලැබූ සමීක්ෂණයේදී දක්නට ලැබුණි.

ශාඛයේ උස මීටර් 2.4 වනතෙක් පාර්ශ්වික අංකුර වැඩෙන්නට ඉඩ නොදිය යුතුයි. පැල එකිනෙකට සමීපව සිටුවා ඇති තවානක, නිසි ලෙස වගා කටයුතු කෙරෙන්නේ නම්, මෙම පාර්ශ්වික අතු වැඩීම දක්නට ලැබෙන්නේ ඉතා කලාතුරකිනි.

3. එක් ක්ලෝනයක් සිටුවා ඇති පාත්තියක් තවත් ක්ලොනයක් සිටුවා ඇති පාත්ති වලින් වෙන් කල යුතුය. මෙසේ වෙන් කිරීමට ගැල්වනයිස් කම්බි දෙපටක් හෝ ඉක්මනින් දිරාපත් නොවන ලී කනු යොදා ගත් වැටක් හෝ යොදා ගත හැකිවේ.

4. මෙසේ වෙන්කල පාත්තිවලට ඇතුළු වීමට වෙනම කපොලු තිබිය යුතුයි.

5. සිටුවා ඇති ක්ලෝනයේ නම සෑම පාත්තියකම පැහැදිලි අකුරෙන් ලියූ නාම පුවරුවක් සවි කල යුතුයි.

6. මෙසේ වෙන් කල එක් පාත්තියක් තුල, කිසිම විටක එක් ක්ලෝනයකට වඩා සිටුවීම නොකල යුතුයි.

7. තවානකින් පළමු වරට බද්ධ අංකුර ලබා ගැනීම සඳහා අතු කැපීමට පෙර, සිටුවා ඇති ක්ලෝනය නිසැකයෙන්ම එම ක්ලෝනයද කියා තවදුරටත් සනාථ කර ගැනීමට රබර් පර්යේෂණායතනයේ තවාන් පරීක්ෂක ඒකකයේ නිලධාරියෙකු ලවා පරීක්ෂා කරවා සහතික කර ගත යුතුයි.

යම් හෙයකින් ක්ලෝන වල මිශ්‍ර වීමක් හෝ වැරදි ක්ලෝනයක් සිටුවා ඇත්නම් මේ අවස්ථාවේදී ඒවා ඉවත්කර දැමිය හැකිවේ.

8. බද්ධ අංකුර ලබා ගැනීම සඳහා අතු කපා ගැනීමට පෙර, බද්ධ සන්ධියේ සිට සෙ.මී. 15 ක් ඉහලින් තාර හෝ සේදී නොයන තීන්ත වර්ගයකින් කඳ වටා පටියක් ලකුණු කල යුතු අතර කිසි විටකත් මේ තාර හෝ තීන්ත පටියට පහලින් අතු වැඩීමට ඉඩ නොදිය යුතුයි. පළමු වරට අතු කැපීමේදී බද්ධ සන්දියට සෙ. මී. 30 ක් උඩින් අතු කැපිය යුතුයි.

9. තවානකට නව ක්ලෝනයක් බද්ධ කිරීමට උවමනා අවස්ථාවකදී එහි වැඩෙන ක්ලෝනයක් මත නැවත බද්ධ කිරීම කිසි විටකත් නොකල යුතුයි.

10. සෑම බද්ධ අංකුර ලබා ගන්නා තවානකම ඒ ඒ ක්ලෝන වලට අයිති ශාක පිහිටි තැන් දැක්වෙන ක්ෂේත්‍ර සැලැස්මක් (field plan) සකස් කල යුතුයි. සෑම ශාකයකටම අනුපිළිවෙලින් අංකයක්දී, එම අංකය ක්ෂේත්‍ර සැලැස්මෙහිද සටහන් කල යුතුයි.

11. බද්ධ අංකුර ලබා ගැනීමට අතු කපා ගැනීමේදී, ඒ කපා ගත් අතු ගණනත්, ලබාගත් ගසේ අංකයත් දිනයත්, සටහන් පොතක (Register) සටහන් කර තැබිය යුතු අතර ඒවා ලබා ගන්නා තැනැත්තාගේ නම හා ලිපිනයද ලියා තැබීම මතු කලකදී ප්‍රයෝජනවත් වනු ඇත.

12. බද්ධ අංකුර ලබා ගන්නා අතු කැපූ විගසම ඒ කපාගත් ක්ලෝනයේ නම කැපුම් මුහුණතෙහි කාබන් පැන්සලයකින් (Copying pencil) ලකුණුකර, කැපුම් මුහුණත රත් කරන ලද ඉටි වල බහා ගත යුතුයි.

ඉහත සඳහන් ක්‍රියාකාරකම් මගින් බද්ධ අංකුර ලබාගන්නා තවානක් ස්ථාපිත කල හොත් ක්ලෝනයන්ගේ මිශ්‍රවීමක් නොවී වෙන් වෙන්ව පවත්වා ගැනීමට අධාර වේ.

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ පලපුරුදු නිලධාරින්ගෙන් සැදුම්ලත්, තවාන් පරීක්ෂක ඒකකයක් පිහිටුවා ඇත. ක්ලෝන හඳුනා ගැනීමෙත්, බද්ධ අංකුර ප්‍රචාරන තවාන් හා ග්‍රාහක පැල පවත්වා ගෙන යෑම පිළිබඳව අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම ඒකකය මගින් සිදුකෙරේ. මෙම සේවාව රාජ්‍ය අංශයේ වතුවලට මෙන්ම පෞද්ගලික තවාන් හිමියන්ටද ලබා ගැනීමට ඉඩ පහසුකම් සලස්වා ඇත.